OL/2017/50-S-I, II (NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | | |
|---|---|---|---|
| නාට්‍ය හා රංග කලාව | I, II | පැය තුනයි | |
| நாடகமும் அரங்கியலும் | I, II | மூன்று மணித்தியாலம் | |
| Drama and Theatre | I, II | *Three hours* | |

## නාට්‍ය හා රංග කලාව I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

* පහත දැක්වෙන පද්‍ය හා ගද්‍ය පාඨ ආශ්‍රයෙන් අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) නන් සිරින් වොරැඳි බරණැස් පුරයේ - තෙද යුත් උතුම් භූපාලනා මා පිය වේ
වී එතරා සිප් සයුරා - ධනු ශිල්පේ ද යුදයට නෙක කඩු හරඹ ද උගත්තෙමිය මම නැණයෙන් සිතු ලෙද

(ii) මහලු මුත් මෙකලට - නොලැබෙයි නිවසෙ හිඳිනට
දරුවොත් නැත පිහිට - රාජකාරිය නොකර බැරි මට

(iii) මෙම ගිම්හාන ග්‍රීෂ්මවූ කාලේ - අපේ උද්‍යානේ ක්‍රීඩා සැපා වේ
යස රම්‍යා වූ සැන්දෑවකී මේ - අපේ උද්‍යානේ ක්‍රීඩා සැපා වේ

(iv) පයින් ඇවිදිල්ල - මහන්සිද මන්ද
ගොඩින් පැනගත්ත - හුඟක් ළඟ හින්ද
මෙහෙත් හරි වැස්ස - එහෙත් හෙම වෙන්නැ
අපොයි හරි වැස්ස - වෙලත් උතුරන්න

**1.** සිංහල නාට්‍ය කලාවේ සන්ධිස්ථානයක් ලෙස සැලකෙන නාට්‍යයට අයත් පද්‍යය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**2.** පහතරට ගැමි රංගයකට අයත් පද්‍යය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**3.** රබන් පද මූලික කරගත් සංගීතයෙන් යුත් නාට්‍ය නිර්මාණයකට අයත් පද්‍යය වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**4.** චාල්ස් ඩයස් සූරින් ගේ නිර්මාණයක් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

* නිවැරදි පිළිතුර තෝරන්න.

**5.** අභිනය යනුවෙන් අදහස් කැරෙන්නේ,
(1) කාව්‍ය ශාස්ත්‍රයට අයත් සංකල්පයකි. (2) වේෂභූෂණ ආදියෙන් යුක්ත වීමකි.
(3) නාට්‍ය පිටපතක් ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කිරීමකි. (4) ඉදිරියට පැමිණවීම යනු යි.

**6.** සමාරෝපය යනු,
(1) නළුවා රංගභූමි පාලක ගේ විධානයන් මත වේදිකාවේ හැසිරීමයි.
(2) නාට්‍ය පිටපත ප්‍රේක්ෂකයා වෙත ගෙනයනු ලබන මාධ්‍යයයි.
(3) රූපණ ශිල්පියා තම පෞද්ගලිකත්වය අත්හැර අනෙකකු ගේ ස්වරූපය ගැනීමයි.
(4) නළුවන් විසින් පෙර පුහුණුව මත සිදු කරනු ලබන්නා වූ නෘත්‍යයයි.

[ දෙවැනි පිටුව බලන්න.

7. වාචික අභිනය ප්‍රබල ලෙස යොදාගනු ලබන ප්‍රාසංගික කලාව වන්නේ,
(1) මුද්‍රා නාට්‍ය ය. (2) ඔපෙරා ව ය. (3) බැලේ නාට්‍ය ය. (4) නෘත්‍යය ය.

8. නාට්‍යයක් රංගගත කිරීම පිණිස තිබිය යුත්තේ,
(1) වේදිකාවක්, කමතක්, කරළියක් හෝ සබයක් ය.
(2) පින්තූර රාමු වේදිකාව, කමත, එරිනාව සහ කරළියයි.
(3) රඟ දැක්වීමට හැකි ඕනෑ ම ස්ථානයකි.
(4) පස්වලින් ගොඩකර තැනූ වහලයකින් යුත් බිමකි.

9. නාට්‍යයක ආනුෂංගික කලා යොදාගැනීමෙන් අපේක්ෂා කැරෙන්නේ,
(1) රංග භූමිය විචිත්‍රවත් කර ගැනීමයි.
(2) වේදිකා මායාව ප්‍රකට කර ගැනීමයි.
(3) නාට්‍යයකට අත්‍යවශ්‍යයෙන් ම එම කලාවන් තිබිය යුතු වීමයි.
(4) නළු-නිළියන්ට රඟපෑම පහසු කිරීමයි.

10. කය හා මනස සැහැල්ලු කරගැනීම පිණිස සුදුසු වූ රංග අභ්‍යාසය වන්නේ,
(1) ශ්වසන අභ්‍යාසයයි. (2) ශිථිලකරන අභ්‍යාසයයි. (3) සංවේදන අභ්‍යාසයයි. (4) ඇවිදීමේ අභ්‍යාසයයි.

11. කරළිය නම් වූ රංග භූමියේ දී නාට්‍යයක් රඟ දක්වන විට ප්‍රේක්ෂකයන්ට,
(1) ඉදිරියේ සිට පමණක් නැරඹිය හැකි ය. (2) පැති දෙකක සිට පමණක් නැරඹිය හැකි ය.
(3) පැති තුනක සිට පමණක් නැරඹිය හැකි ය. (4) රංග භූමිය වටේට ම සිට නැරඹිය හැකි ය.

12. ලෝකධර්මී ශෛලිය බහුල වශයෙන් යොදාගත් ලොව ප්‍රකට නාට්‍ය දෙකකි.
(1) ජූලියස් සීසර් හා කොකේසියන් චෝක් සර්කල් (2) ඊඩිපස් රජ හා ඇන්ටිගනී
(3) අභිඥානශාකුන්තලය හා මෘච්ඡකටිකය (4) ඩෝල්ස් හවුස් හා වෛරිඹර්වාඩ්

13. අංග රචනයේ දී මුහුණ ප්‍රධාන වශයෙන් බෙදා දක්වනු ලබන්නේ
(1) කොටස් හතරකට ය. (2) කොටස් පහකට ය. (3) කොටස් හයකට ය. (4) කොටස් හතකට ය.

14. ප්‍රධාන අංග රචනා ප්‍රභේද දෙකකි,
(1) සත්ත්ව අංග රචනය හා මිනිස් අංග රචනය (2) චරිත අංග රචනය හා මුහුණේ අංග රචනය
(3) සෘජු අංග රචනය හා චරිතාංග අංග රචනය (4) වේදිකා අංග රචනය හා රූපලාවණ්‍ය අංග රචනය

● පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **15** සිට **19** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය/අනුවර්තනය | මෙරට නිෂ්පාදක |
|---|---|---|---|
| කැට් ඔන් ද හොට් ටින් රූෆ් | ක | හෙලේ නැග්ග ඩෝං පූතා | සුගතපාල ද සිල්වා |
| චරන්දාස් | හබීබ් තන්විර් | චරන්දාස් චෝර් | ග |
| ජ | සොෆොක්ලීස් | බෙරහඬ | බන්දුල ජයවර්ධන |
| ද ග්ලාස් මෙනාජරි | ටෙනසී විලියම්ස් | ට | හෙන්රි ජයසේන |
| ද මැරේජ් | ඩ | කපුවා කපෝති | විශ්වවිද්‍යාලයීය සිංහල සමිතිය |

15. ඉහත වගුවේ 'ක' කොටුවට ඇතුළත් විය යුතු රචකයා ගේ නම කුමක් ද?
(1) හෙන්රික් ඉබ්සන් (2) මැක්සිම් ගෝර්කි (3) ගාර්සියා ලෝර්කා (4) ටෙනසී විලියම්ස්

16. ඉහත වගුවේ 'ග' කොටුවට ඇතුළත් විය යුතු මෙරට අධ්‍යක්ෂ ගේ නම කුමක් ද?
(1) ජයලත් මනෝරත්න (2) රංජිත් ධර්මකීර්ති (3) පරාක්‍රම නිරිඇල්ල (4) ගුණසේන ගලප්පත්ති

17. ඉහත වගුවේ 'ජ' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
(1) රූඩන්ස් (2) ඉක්නෙව්ටාලු (3) සවුන්ඩ් ඔෆ් ද ඩ්‍රම් (4) යෙර්මා

18. ඉහත වගුවේ 'ට' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
(1) අහස් මාළිගා (2) වැදගත්කම (3) හුණුවටයේ කතාව (4) මාකරාක්ෂයා

19. ඉහත වගුවේ 'ඩ' කොටුවට අයත් රචකයා ගේ නම කුමක් ද?
(1) ප්ලේටස් (2) සැමුවෙල් බෙකට් (3) රේ කුනී (4) නිකොලායි ගොගොල්

20. නාඩගම් සඳහා ආලෝකය ලබා දුන් පහන් විශේෂය වන්නේ,
(1) ධාරාලෝක පහන් (2) කිට්සන් පහන් (3) විදුලිය පන්දම් (4) යොමු පහන්

/ තුන්වැනි පිටුව බලන්න.

21. නාට්‍යෝපකරණ,
(1) නාට්‍යයේ ක්‍රියාවලිය හා බැඳී පැවතිය යුතු ය.
(2) අඩු මිල අමුද්‍රව්‍යවලින් සැකැසුණු සැහැල්ලු ඒවා විය යුතු ය.
(3) නාට්‍යයේ අංක අතර වෙනස් කළ යුතු ය.
(4) ශිල්පීය නිපුණත්වය ප්‍රකට වන සේ නිමා කළ යුතු ය.

22. මද්දලය ප්‍රධාන සංගීත භාණ්ඩයක් ලෙස යොදාගත් නාට්‍ය විශේෂය,
(1) කෝලම් ය. (2) සොකරි ය. (3) නාඩගම් ය. (4) මිනර්වා නාට්‍ය ය.

23. රංග රචනා ශිල්පයෙහි ලා වඩාත් ප්‍රකට වන්නේ,
(1) ඉන්දු ධර්මසේන (2) ජෙරම් ද සිල්වා (3) රුවන්ති ද චිකේරා (4) මාර්ක් ඇන්ටනි ප්‍රනාන්දු

● පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් **24** සිට **27** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


ක


ග


ජ


ට

24. '**මිනර්වා**' නාට්‍ය රූපණයෙහි ප්‍රකට වූ චරිතය ඇත්තේ කවර ඡායාරූපයේ ද?
(1) 'ක' (2) 'ග' (3) 'ජ' (4) 'ට'

25. පිටපත් රචනයෙහි, රූපණයෙහි හා ළමා නාට්‍ය නිර්මාණකරණයෙහි ප්‍රකට වූයේ,
(1) 'ක' (2) 'ග' (3) 'ජ' (4) 'ට'

26. ගාර්ෂියා ලෝර්කා ගේ යෙර්මා නාට්‍ය දේශීය අනුවර්තනයක් ලෙසින් නිර්මාණය කළේ,
(1) 'ක' (2) 'ග' (3) 'ජ' (4) 'ට'

27. මුද්‍රා නාට්‍ය ශිල්පයෙහි ප්‍රකට වන්නේ,
(1) 'ක' (2) 'ග' (3) 'ජ' (4) 'ට'

● පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් **28** හා **29** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


ක


ග

28. ඉහත 'ක' හා 'ග' ඡායාරූප දෙකෙන් දැක්වෙන්නේ,
(1) 'ක' සන්නි මුහුණකි 'ග' කෝලම් මුහුණකි.
(2) 'ක' කෝලම් මුහුණකි 'ග' සන්නි මුහුණකි.
(3) 'ක' හා 'ග' දෙකම කෝලම් මුහුණු දෙකකි.
(4) 'ක' හා 'ග' දෙකම සන්නි මුහුණු දෙකකි.

29. ඉහත 'ක' හා 'ග' මුහුණු දෙක,
(1) 'ක' අමුක්කු සන්නියයි 'ග' ජස කෝලමයි.
(2) 'ක' ආරච්චි කෝලමයි 'ග' මූර්තු සන්නියයි.
(3) 'ක' හේවා කෝලමයි 'ග' අඬබෙර කෝලමයි.
(4) 'ක' ගොළු සන්නියයි 'ග' කණ සන්නියයි.

[ හතරවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

● පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් **30** සිට **33** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ක | ග | ජ | ට |
|---|---|---|---|
| වඩිග බමුණා | බහුබූතයා | පාළඟ | මිළිඳු රජ |
| ඇඳුරා | පොතේ ගුරු | පත්තිනි | ආලවක යක්ෂයා |

**30.** සබරගමු ප්‍රදේශයේ ශාන්තිකර්මයන්ට අයත් නාට්‍යමය චරිත අඩංගු කාණ්ඩය වන්නේ,
(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

**31.** දේශීය නාඩගම් හා බැඳි චරිත දැක්වෙන කාණ්ඩය වන්නේ,
(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

**32.** සූනියම් කැපීම ශාන්ති කර්මයට අයත් චරිත අඩංගු කාණ්ඩය,
(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

**33.** බෞද්ධ පූජා කර්මයන්ට අයත් නාට්‍යමය ලක්ෂණ සහිත චරිත අඩංගු කාණ්ඩය වන්නේ,
(1) 'ක' ය. (2) 'ග' ය. (3) 'ජ' ය. (4) 'ට' ය.

**34.** පී.අයි. චයිකොව්ස්කි විසින් නිර්මාණය කරන ලද ප්‍රකට බැලේ නාට්‍යය වන්නේ,
(1) ස්වෝන් ලේක් (2) ද ස්ලීපිං බියුටි (3) සින්ඩරෙල්ලා (4) ද ෆයර් බර්ඩ්

**35.** දිගු කාලීන පෙර පුහුණුව මගින් රිද්මයානුකූල චලනයන් හා සමබරතාව වඩාත් ප්‍රකට ව පෙනෙන්නේ,
(1) ඔපෙරා ශිල්පීන්ටයි (2) අභිරූපණ ශිල්පීන්ටයි. (3) බැලේ ශිල්පීන්ටයි. (4) මුද්‍රා නාට්‍ය ශිල්පීන්ටයි.

**36.** කෙටි නාට්‍යයක,
(1) චරිත සීමිත ය; ඒකාංක ය.
(2) බොහෝ චරිත වේ; අංක කිහිපයක් කෙටි කිරීමකි.
(3) දිගු නාට්‍යයක් කෙටි කර කෙටි කාලයක් තුළ රංගගත කිරීමයි.
(4) කෙටි කාලයක් තුළ කෙටි කතාවක් රංගගත කැරේ.

● අංක **37** සිට **40** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරන්න.

**37.** කෝලම් නාටක චරිතයක් **නොවන්නේ,**
(1) කාරිය කරවන රාළ (2) ආරච්චි (3) බහුබූතයා (4) හේවායා

**38.** පහත සඳහන් නම් අතුරින් නාඩගම් රචකයකු **නොවන්නේ,**
(1) පේදුරු සිංඤෝ (2) පිලිප්පු සිංඤෝ (3) චාල්ස් ආබෲව් (4) චාල්ස් ඩයස්

**39.** දේශීය ජන නාට්‍ය හෝ ජන සංගීතයෙන් ආභාසය **නොලබාගත්** නාට්‍යය
(1) සක්කාය දිට්ඨි (2) යක්ෂාගමනය (3) දෙපානෝ (4) පරාස්ස

**40.** කෝලම් නාටකවලට අදාළ **නොවන** වරණය කුමක් ද?
(1) කතා පුවත ඉදිරිපත් කිරීමෙන් පසු ස්ථාවර රංග පාත්‍රයෝ පැමිණෙති.
(2) කෝලම් නාටකවල රජු හා බිසව වෙස්මුහුණු ද පළඳියි.
(3) සියුම් උපහාසය හා හාස්‍ය රසය ඇත.
(4) ගුණදාස ගුරුන්නාන්සේ ප්‍රකට කෝලම් නාට්‍යකරුවෙකි.

* *

/ පස්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

NEW 50 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

## නාට්‍ය හා රංගකලාව II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. **විකෘති** නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (i) විකෘති නාට්‍යය කවර සියවසේ කවර දශකයේ දී නිර්මාණය වූවක් ද? (ලකුණු 02 යි)
   (ii) තිරය විවර වීමත් සමග ම එම නාට්‍යයේ ප්‍රේක්ෂකයා දකින දර්ශනය කුමක් ද? (ලකුණු 02 යි)
   (iii) ප්‍රියංගනී පාසල් විෂයයන් අතර වඩාත් දක්ෂතාවක් දක්වන්නේ කවර විෂයකට ද? (ලකුණු 02 යි)
   (iv) ප්‍රියංගනී ගේ අපේක්ෂා වෙනත් මගකට යොමු කරනු ලබන්නේ කවුරුන් විසින් ද? එම චරිතයේ නම කුමක් ද? (ලකුණු 02 යි)
   (v) නාට්‍යය අවසානය වන විට ප්‍රියංගනී ගේ චරිත ස්වභාවය කවර ආකාර වේ ද? (ලකුණු 02 යි)
   (vi) මෙම නාට්‍යයෙන් ඉදිරිපත් කෙරෙන්නේ කවර අදහසක් ද? (ලකුණු 02 යි)

2. (i) ප්‍රාසංගික කලාව යනු කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)
   (ii) නාට්‍යය හැර සෙසු ප්‍රාසංගික කලා **තුනක්** නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) සෙසු ප්‍රාසංගික කලාවනට වඩා නාට්‍ය කලාවෙහි ඇති විශේෂත්වය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) නාට්‍යයක ගැටුම යන්න පහදන්න. (ලකුණු 02 යි)
   (ii) ගැටුම ප්‍රභේද කර දක්වන්න. (ලකුණු 04 යි)
   (iii) ඔබ නැරඹූ ප්‍රසිද්ධ නාට්‍යයක් ඇසුරෙන් ගැටුම් ප්‍රභේද දැක්වෙන අවස්ථා නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4. ප්‍රොසීනියම් රංග භූමියේ භූගෝලීය බෙදීම මෙන් ම දෘෂ්ටි රේඛාව ද මනඃකල්පිත වේ.
   (i) රංග භූමිය කොටස් කීයකට බෙදා දැක්වේ ද? (ලකුණු 02 යි)
   (ii) එම බෙදීම් රූපසටහනක් ඇඳ නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) රංග භූමිය ප්‍රායෝගික ව භාවිත කිරීමේ දී දැනගත යුතු කරුණු **හයක්** ලියන්න. (ලකුණු 06 යි)

5. (i) මඩු ශාන්තිකර්ම වඩාත් ප්‍රචලිත පළාත කුමක් ද? (ලකුණු 02 යි)
   (ii) මඩු ශාන්තිකර්ම **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
   (iii) මඩු ශාන්තිකර්මයක නාට්‍යමය අවස්ථාවක් විස්තර කරන්න. (ලකුණු 07 යි)

6. (i) මුල් ම සිංහල නූර්තිය නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) නූර්ති රචකයන් දෙදෙනකු නම් කර ඔවුන් ගේ නූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) නූර්තිහි රංග ශෛලිය විස්තර කරන්න. (ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙනයමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. මෙහි දී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩු වැඩි කරගත හැකි ය.

   "පාසල් නිවාඩු දිනයේ දී නාට්‍ය පුහුණුව පිණිස මුලින් ම පාසලට පැමිණෙන්නේ සෙව්වන්දි, හංසිකා හා චමිත් ය. ඔවුහු එකිනෙකා සමග සුහද කතාවක යෙදෙමින් සිටියදී පාසල් පිට්ටනිය දෙසින් නැගුණු යාන්ත්‍රික හඬක් ඇසී එදෙස බලති. අවට ලෝකය තුළ කෙදිනක හෝ නොදුටු ආකාරයේ යානයකින් එළියට බැසගත් සුවිශේෂී පෙනුමකින් යුත් ප්‍රමාණයෙන් උස අඩු ජීවීන් දෙදෙනකු ඔවුන් දෙස බලා සිටිනු දකිති."

   (i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04 යි)
   (ii) සංවාද හා රංග විධාන සහිත ව පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 08 යි)

* * *

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

### සිංහල මාධ්‍ය

- [ ] 10-11 සිංහල ව්‍යාකරණ
- [ ] 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] භූගෝල විද්‍යාව
- [ ] පුරවැසි අධ්‍යාපනය
- [ ] පෙරදිග සංගීතය
- [ ] නර්තනය
- [ ] නාට්‍ය හා රංග කලාව
- [ ] චිත්‍ර කලාව
- [ ] තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය
- [ ] සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- [ ] කෘෂි හා ආහාර තාක්ෂණය
- [ ] ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

### සිංහල මාධ්‍ය

- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] බුද්ධ ධර්මය
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

### English Medium

- [ ] Buddhism
- [ ] Mathematics - 1
- [ ] Mathematics - 2
- [ ] Biology
- [ ] Physics
- [ ] Chemistry
- [ ] History
- [ ] Business & Accounting Studies
- [ ] Geography
- [ ] Civic Education
- [ ] ICT
- [ ] Health & Physical Education
- [ ] 10-11 English Literary (Poetry)
- [ ] 10-11 English Literary (Drama)
- [ ] 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

### English Medium

- [ ] Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

### සිංහල මාධ්‍ය

- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] සිංහල රචනා අත්වැල
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව

# Grade 10 - Short Notes

**English Medium**

- Buddhism
- Mathematics - 1
- Mathematics - 2
- Biology
- Physics
- Chemistry
- History
- Business & Accounting Studies - 1
- Business & Accounting Studies - 2
- Geography
- Civic Education
- ICT
- Health & Physical Education

- ඉතිහාසය
- ඉතිහාසය රූප සටහන් අශ්‍රිත කෙටි සටහන්
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2
- භූගෝල විද්‍යාව
- පුරවැසි අධ්‍යාපනය
- පෙරදිග සංගීතය
- නර්තනය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර කලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- කෘෂි හා ආහාර තාක්ෂණය
- ගෘහ ආර්ථික විද්‍යාව
- ජපන් භාෂාව

# Grade 10 - Model Papers

**English Medium**

- Mathematics
- Science
- Civic Education
- Geography
- English Activity Book
- English Work Book

# 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සිංහල භාෂාව හා සාහිත්‍යය
- බුද්ධ ධර්මය
- ගණිතය
- විද්‍යාව
- ඉතිහාසය
- පුරවැසි අධ්‍යාපනය
- භූගෝල විද්‍යාව
- පෙරදිග සංගීතය

# අනෙකුත් ග්‍රන්ථ

- හෙළදිව කතිකාවත - අරුණශාන්ත අමරසිංහ
- හොල්මන් අවතාර සහ යකඳුරන් - අරුණශාන්ත අමරසිංහ
- සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

# පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

- 10-ශ්‍රේණිය - විද්‍යාව
- 11-ශ්‍රේණිය - විද්‍යාව

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.